KleenPark

The Details in Detail

# සේවා දිවුරුම් ප්‍රකාශයයි

**ක්ලීන්පාර්ක් පුද්ගලික සමාගමෙ සේවයේ නියුතු ස්ථානයේ පදිංචි නම, ජාතික හැදුනුම්පත් අංකය සහ ආගම භක්තික සේවකයකු වන මම ක්ලීන්පාර්ක් පුද්ගලික සමාගමෙහි සේවයේ නියුතු සියළු දෙනා විසින් අනුගමනය කළ යුතු පහත දැක්වෙන ආචාර ධර්ම පද්ධතිය අවංකවත් සත්‍ය ලෙසත් ගරු ගාම්භීරතා පූර්වකවත් ප්‍රතිඥා/දිව්රුම් දී ප්‍රකාශ කර අකුරටම පිළිපදින බවට පොරොන්දු වෙමි.**

## 1. වෘත්තිය වෙනුවෙන් වූ මාගේ කැපවීම.

1. 1 ක්ලීන්පාර්ක් පුද්ගලික සමාගමෙහි මාගේ සේවා කාලය තුළ සේවා කටයුතු වලදීත් ඉන් බැහැරවත් සෑම අවස්ථාවකම අවංකව සහ සත්‍යවාදී ලෙස ආයතනයේ ගරුත්වයට කැළලක් නොවන ලෙස ක්‍රියා කරමි.

1. 2 මට පැවරී ඇති සියළුම සේවා කාර්යයන් ආයතනය විසින් ලබා දී ඇති තාක්ෂණික උපකරණ සහ පිරිසිදු කාරක ද්‍රව්‍යයන් නිසි අයුරින් උපයෝගී කොට ගෙන ක්ලීන්පාර්ක් පුද්ගලික සමාගමෙහි උසස් තත්ව පාලනයට අනුකූලව ඉටු කරමි.

1. 3 වාහන සේවා කාර්යයන් උසස් මට්ටමකින් ඉටු කිරීම සදහා ආයතනය විසින් වරින් වර ලබා දෙන සියළු වෘත්තීය පුහුණු කිරීම් සහ වැඩමුළු සඳහා නිරන්තරයෙන් සහභාගී වන බවටත් එම ඉගැන්වීම් වලට අනුකූලව සේවා කටයුතු ඉටු කිරීමට කැප වෙන බවටත් මම පොරොන්දු වෙමි.

## 2. සේවා දායකයා වෙනුවෙන් වූ මාගේ කැපවීම.

2. 1 සේවාවන් සැපයීමේදී සේවා දායකයාගේ වාහනයට අවශ්‍ය වන ගැලපෙන සහ ප්‍රයෝජනවත් වන සේවා සහ භාණ්ඩ පමණක් නිර්දේශ කරන බවට මම පොරොන්දු වෙමි.

2. 2 ආයතනයට ආදාල මාගේ විකුණුම් ඉලක්ක සපුරා ගැනීම වෙනුවෙන් සේවාදායකයාගේ වාහනයට අවශ්‍යය නොවන සහ ප්‍රයෝජනවත් නොවන කිසිදු සේවාවක් හෝ භාණ්ඩයක් නිර්දේශ නොකරන බවටත් මම පොරොන්දු වෙමි.

2. 3 සියළුම සේවා දායකයන්ට කිසිදු වෙනසක් නොමැතිව එක හා සමානව උපරිම තත්වයේ සේවාවක් ලබා දෙන බවට මම පොරොන්දු වෙමි.

## 3. පෞද්ගලික ගරුත්වය සහ අභිමානය වෙනුවෙන් මාගේ කැපවීම.

3. 1 සේවා කාලය තුළදී හා ඉන් පිටතදීත් මා ඇසුරු කරන සියලු දෙනාගේ පෞද්ගලික ගරුත්වය, අභිමානය, නිදහස සහ මානව හිමිකම් ආරක්ෂා වන ආකාරයෙන් කටයුතු කරන බවට මම පොරොන්දු වෙමි.

3. 2 සේවා කාලය තුළදීත් ඉන් බැහැරවත් මා ඇසුරු කරන කිසිවෙකුටත් ජාති, ආගම්, කුල හෝ වර්ණ භේද මුල් කොට ගෙන කිසිදු වෙනසක් නොකරන බවට මම පොරොන්දු වෙමි.

3. 3 ක්ලීන්පාර්ක් පුද්ගලික සමාගමේ සේවය කරන්නන් විවිධ ආගම් සහ ඇදහිලි වලට අයත් වන්නන් බව මා පිළිගන්නා අතර ඔවුන්ගේ එම ඇදහිලි සහ විශ්වාසයන්ට මම ගරු කරමි. ඔවුන්ගේ එම ඇදහිලි සහ විශ්වාසයන්ට කිසිදු අගතියක් වන ලෙස හැසිරීමෙන් හෝ වාද විවාද වල යෙදීමෙන් වැලකී සිටින බවටත් මෙයින් පොරොන්දු වෙමි.

3. 4 ක්ලීන්පාර්ක් පුද්ගලික සමාගමේ සේවය කරන්නන් විවිධ දේශපාලනික අදහස් හා මත දරන්නන් බව මා පිලිගන්නා අතර ඔවුන්ගේ එම දේශපාලනික මති-මාතාන්තර වලට අගතියක් වන ආකාරයේ හැසිරීම් වලින් හෝ වාද විවාද වල යෙදීමෙන් වැලකී සිටින බවටත් මෙයින් පොරොන්දු වෙමි.

3. 5 සේවා කාලය තුළදී කිසිදු අවස්ථාවක ආයතනයේ සේවය කරන්නකුගේ හෝ සේවා දායකයකුගේ හෝ වෙනත් අයකුගේ සිත් රිදෙන ආකාරයෙන් ඔහු හෝ ඇය ආමන්ත්‍රණය නොකරන අතර කිසි විටෙකත් ඔවුන්ගේ ගෞරවයට හෝ අභිමානයට කැළලක් වන ආකාරයෙන් වැරදි හෝ අශෝභන වචන භාවිතා කිරීමෙන් වළකින බවටත් මම පොරොන්දු වෙමි.

3. 6 සේවා කාලය තුළදී මාගේ ජ්‍යෙෂ්ඨ නිලධාරීන්ට ගරු කරන අතර ඔවුන්ගේ නියෝග සහ උපදෙස් නොකඩවා පිළිපදින බවට මා පොරොන්දු වන අතර එම නියෝග සහ උපදෙස් සම්බන්ධව කිසියම් ගැටළුවක් හෝ පැහැදිලි කර ගැනීමක් අවශ්‍ය නම් ආයතනයේ වඩාත් ජ්‍යෙෂ්ඨ නිලධාරියෙකුගෙන් හෝ මාගේ කළමණාකාර අධ්‍යක්ෂක තුමාගෙන් එය අසා පැහැදිලි කර ගනිමි.

3. 7 ක්ලීන්පාර්ක් ආයතනයේ සේවකයකු ලෙස ආයතනයට සම්බන්ධ කිසිදු කටයුත්තක් වෙනුවෙන් අල්ලසක් ලෙස කිසිදු ත්‍යාගයක්, ත්‍යාග මුදලක්, පාරිතෝෂිකයක්, කොමිස් මුදලක් හෝ වෙනයම් ආකාරයක මුදලක් කිසිදු පුද්ගලයෙකුගෙන් හෝ ආයතනයකින් ලබා නොගන්නා බවට මම පොරොන්දු වෙමි.

**4. ආයතනික දේපළ සුරැකීම සහ පරිහරණය.**

4. 1 ක්ලීන්පාර්ක් ආයතනයට අයත් සියළු චංචල සහ නිශ්චල දේපළ ආරක්ෂාකාරී ලෙස පරිහරණය කරන බවටත් එම දේපළ ආයතනයේ සේවා කටයුතු වෙනුවෙන් පමණක් භාවිතා කරන බවටත් පොරොන්දු වෙමි.

4. 2 සේවා කාලය තුළදී හෝ සේවයෙන් ඉවත් වූ පසුව හෝ ආයතනයට පමණක් අයිති වූ බුද්ධිමය දේපළ සහ වෙනත් තොරතුරු ක්ලීන්පාර්ක් ආයතනයෙන් බැහැර කිසිදු පුද්ගලයෙකුට හෝ ආයතනයකට නොදෙන බවට පොරොන්දු වෙමි.

4. 3 ආයතනයේ අගතියට හෝ පරිහානියට මුල් වන කිසියම් සිද්ධියක් හෝ තොරතුරක් වෙතොත් ඒ බව ඒ අවස්ථාවේදීම එම තොරතුරු සත්‍යවාදීවත් නිවැරදිවත් මාගේ උසස් නිළධාරීන්ට වාර්තා කරන බවටත් මම පොරොන්දු වෙමි.

4. 4 සේවා කාලය තුළදී හෝ ක්ලීන්පාර්ක් ආයතනයෙන් ඉවත් වූ පසු මොනයම් කාලයකදී හෝ ක්ලීන්පාර්ක් සමාගමේ කිසිදු සේවකයෙකු හෝ සේවා දායකයෙකු වෙනත් ආයතනයකට පෙළඹවීම හෝ යොමු නොකරන බවට මම පොරොන්දු වෙමි.

**5. පෙර සේවා යෝජකයින් වෙනුවෙන් වූ මාගේ වගකීම හා කැපවීම.**

5. 1 ක්ලීන්පාර්ක් ආයතනයේ සේවා කාලය තුළදී මගේ පෙර සේවා යෝජකයින්ගේ සේවකයින් සහ සේවාදායකයන් ක්ලීන්පාර්ක් ආයතනයට පෙළඹවීම හෝ යොමු නොකරන බවට මම පොරොන්දු වෙමි.

5. 2 සේවා කාලය තුළදී හෝ ක්ලීන්පාර්ක් සමාගමේ සේවයෙන් ඉවත්වූ පසු හෝ මගේ පෙර සේවා යෝජකයින්ගේ තොරතුරු සහ බුද්ධිමය දේපළ වලට අදාළ කිසිදු තොරතුරක් ක්ලීන්පාර්ක් ආයතනයට ලබා නොදෙන බවට මම පොරොන්දු වෙමි.

**6. පරිසරය රැකගැනීම වෙනුවෙන් වූ මාගේ කැපවීම.**

6. 1 සේවා කටයුතුවලදී ජලය විදුලිය ඇතුළු පරිසර හිතකාමී සම්පත් අරපිරිමැස්මෙන් පරිහරණය කරන බවට මම පොරොන්දු වෙමි.

6. 2 සේවා කටයුතු වලදී ආයතනය විසින් අනුමත කර ඇති පරිසරයට හානියක් නොවන පිරිසිදුකාරක සහ ද්‍රව්‍යයන් පමණක් භාවිතා කිරීමට මම පොරොන්දු වෙමි.

6. 3 සේවා කටයුතු වළදී මධ්‍යම පරිසර අධිකාරියේ සියළු රෙගුලාසි වලට අනුකූලව ක්‍රියා කරන බවටත් කිසිදු අපද්‍රව්‍යයක් අවට පරිසරයට මුදා හැරීමෙන් වළකින බවටත් එම අපද්‍රව්‍ය සියල්ලම ආයතනය විසින් සපයා ඇති විශේෂ බහාලුම් තුළට පමණක් දමන බවටත් මම පොරොන්දු වෙමි.

★★★★★★★★★★★★★★★